
(ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ඉරුදින නව දහම් පාසල් පොදු
පාඨමාලාවට අනුව සකසන ලද පාඩම් සඳහා ක්‍රියාකාරකම්)

# 8 වන ශ්‍රේණිය



සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය,
කොළඹ දියෝකීසිය



8 වන ශ්‍රේණිය - 1 වන පාඩම

# දෙවියන් වහන්සේ කෙරෙහි මම බලා සිටිමි.

**බයිබල් කොටස: ගීතාවලිය 63:1-8**

**හැඳින්වීම:**

දාවිත් රජ අබිසලොම් රජුගෙන් පලා යැමේදී ජුදා පාළුකරයේ සිට ගායනා කළ ගීතයකි. දාවිත් රජු ජීවිතයේ විවිධ අත්දැකීම් තුළ දී දෙවියන් වහන්සේට ප්‍රශංසා ගී ගැයූ අතර, පීඩා කාලවලදී පවා එසේ කළේය.

1. දෙවියන් වහන්සේ තුළ ඔබ බලාපොරොත්තු තබා ඇති කරුණු කිහිපයක් සඳහන් කරන්න

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

2. ඔබට දෙවියන් වහන්සේ මුණගැසෙන ආකාර කිහිපයක් ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

3. ඔබ ලබා ඇති ජයග්‍රහණයක් පිළිබඳ දෙවියන් වහන්සේට ස්තුති කරමින් පද පේළි කිහිපයක් ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

**අදාල කිරීම**

1. දෙවියන් වහන්සේ සියලු අවස්ථාවන්හිදී ප්‍රශංසාවත් මහිමයත් ලබන්නට සුදුසුය.
2. අපේ ජිවිතයේ ඕනෑම අවස්ථාවකදී දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම වැදගත්වේ.
3. වර්තමානයේ කොරෝනා වෛරසය නිසා මුළු ලොවම කලබලයට පත්ව සිටින වේලාවක දෙවියන් වහන්සේ ඔබට දුන් රැකවරණය ගැන මෙනෙහි කරමින් ස්තුති කරන්න.

කටපාඩම් පදය: **"මුළු ජීවිතයේදීම මම ඔබට ප්‍රශංසා කරන්නෙමි, ඔබේ නාමයෙන් අයැදිමින් මම ඔබ දෙසට දෑත් නගන්නෙමි."**

ගීතාවලිය 63:4



සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය



## 8 වන ශ්‍රේණිය - 2 වන පාඩම

# දිවැසිවරුන්

## (පැරණි ගිවිසුම් දිවැසිවර සේවය හඳුනාගැනීම).

**දිවැසිවරුන් කිහිප දෙනෙකුගේ නම් සහ බයිබල් පාඨ පහත සඳහන් වේ.**
**එලියා - 1 රාජාවලිය 17:1 " එලිෂා - 1 රාජාවලිය 19:19 -21" යෙසායා - යෙසායා 1:1 ; 6:1-13" ජෙරමියා - ජෙරමියා 1:4-10" එසකියල් 2: 1-5**

### හැඳින්වීම

දිවැසිවරයා යනු කලින් ප්‍රකාශ කරන්නා හෙවත් දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන්නාය. හෙතෙම දෙවියන් වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ ඉදිරිපත් කරයි. බයිබලයේ දිවැසිවරුන්ට ආරෝපණය කර ඇති විශේෂත්වය නම් දේව ආනුභාවය ලැබී ඇති බවයි. දිවැසිවරයා කැඳවනු ලැබ, අණකරනු ලැබ, බල කරනු ලැබ ඇත්තේ දේවත්වය ඇසුරෙන්ය. දෙවියන් වහන්සේ විසින් දිවැසිවරයට ලබා දෙන පණිවිඩය ඒ අයුරින්ම ජනතාවට ලබා දීම ඔහුගේ වගකීම වේ.

ප්‍රධාන දිවැසිවරු 4 දෙනෙකි. යෙසායා, ජෙරමියා, එසකියෙල්, දානියෙල්
සුළු දිවැසිවරු 12 දෙනෙකි. හොසියා, ජෝවෙල්, ආමෝස්, ඔබදියා, ජෝනා, මීකා, නාහුම්, හබක්කුක්, ශෙපනියා, හග්ගයි, සෙකරියා, සහ මලාකි.

දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව ලද මෝසෙස් දිවැසිවරයෙකු ලෙස සලකන අතර වීරාවලිය සමයේද විටින් විට දිවැසිවර හඬ ඇසී ඇත. සාමුවෙල් ද ඉශ්රායෙල් ජනතාවට දේව හඬ ගෙන ආ දිවැසිවරයෙකු වන අතර සාවුල් දාවිත් සහ සලමොන් රාජකීයත්වයට පත් කිරීමට එතුමන් කටයුතු කලේය. එලියා සහ එලිෂා ද වැදගත් දිවැසිවරුන් ලෙස සඳහන් වේ. දිවැසිවරු මගින් ඉශ්රායෙල් රාජ්‍යයේ අභ්‍යන්තර ඉරණම ගැන, මෙසායනික දිවැස්වැකිය නම් වූ ඉශ්රායෙල් සහ මුළු ලෝකය මුදා ගන්නා ගැලවුම්කරුවාණන් පිළිබඳ දිවැස්වැකිය පිළිබඳ මෙන්ම, යුගාන්තයේදී උන්වහන්සේගේ රාජ්‍යය මිහිපිට ඇතිවන ආකාරය ගැනද සඳහන් වේ.

**හැඳින්වීම කොටස කියවා පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

1. දිවැසිවරයා යනු

   ..........................................................................................................................

2. දිවැසිවරයාගේ වගකීම

   ..........................................................................................................................

3. ප්‍රධාන දිවැසිවරු දෙදෙනෙකු සහ සුළු දිවැසිවරු දෙදෙනෙකු නම් කරන්න.

   ..........................................................................................................................

4. ඔබ වැඩියෙන් කැමති දිවැසිවර චරිතය කුමක්ද?

   ..........................................................................................................................

5. එම චරිතයට ඔබ කැමති වන හේතුව කුමක්ද?

   ..........................................................................................................................

- ❖ වර්තමානයේ අප අවට බොහෝ අයුක්තිය සහ අසාධාරණය දැකිය හැක. ඔබ දකින අයුක්තිය සහ අසාධාරණ ඇති තැන් මොනවද ? දෙවියන් වහන්සේගේ වචනය සමාජයට ගෙනයන පිණිස ඔබට කැඳවීම ලැබෙන්නේ නම් ඔබගේ ප්‍රතිචාරය කුමක්වේද ?

**කටපාඩම් පදය :** **"දෙවියන් වහන්සේ මෙසේ වදාරන සේක, අන්තිම දවස් වලදී සකල මනුෂ්‍යන් මාගේ ආත්මානුභාවයෙන් පුරවාලමි. එවිට ඔබේ දූ පුත්තු දිවැස් වැකි කියති. ඔබේ දූ පුත්තු දිවැස් වැකි කියති, ඔබේ තරුණයෝ දර්ශන දකිති. ඔබේ මහල්ලෝ ද පැතුම් පතති."** ( ක්‍රියා 2: 17)



**8 වන ශ්‍රේණිය - 3 වන පාඩම**

# එලියාට විශ්වාසවන්ත වූ දෙවියන් වහන්සේ

**බයිබල් කොටස : 1 රාජාවලිය 18(21-45 (මෙම බයිබල් කොටස කියවන්න)**

**කට පාඩම් පදය : "සමිඳුන් කෙරෙහි බලා සිටින්න, ශක්තිමත් වන්න, ධෛර්යවත් වන්න සමිඳුන් කෙරෙහි බලා සිටින්න. "**

ගීතාවලිය 27:14

**හැඳින්වීම:** එලියා දෙවියන් වහන්සේගේ කැඳවීම ලත් දිවැසිවරයෙකි. ක්‍රි.පූ . 9 වන සියවසේ ජීවත් වූ අතර "සමිඳාණන් වහන්සේ දෙවිඳුන් වන සේක" යන්න ඔහුගේ නමේ තේරුම වේ. අහබ් රජ බාල් දෙවියන් අදහන ජේසබෙල් නම් රැජිනක විවාහ කරගැනීම නිසා ඉශ්‍රායෙල් ජනතාවද බාල් දෙවියන් නමස්කාරයට හුරු වී සිටි අතර, මේ කාලයේදී දෙවියන් වහන්සේගේ වචනය අහබ් රජුට ගෙන යාමට එලියා කැඳවනු ලැබීය. මේ නිසාම අහබ් රජු එලියා සමග තරහින් පසුවිය.

(බයිබලය කියවා කථාන්දරය ඉගෙන ගන්න).

1. දෙවියන් වහන්සේ එකම සර්වබලධාරී දෙවියන් වහන්සේ බව ඔබ පිළිගන්නේද?

........................................................................................................................................

2. අප ජීවත්වන සමාජය තුළ දේවත්වය අදාල කරන බොහෝ දේ ඇත. ඒවා අතරින් කිහිපයක් නම් කරන්න.

........................................................................................................................................

3. ඔබගේ ඇදහිල්ල එකම දෙවියන් වහන්සේ කෙරෙහි තබමින් වර්තමානයේ මුහුණ දෙන කොවිඩ් වෛරසය ජය ගැනීමට ඔබ ක්‍රියා කරන විටදී ඔබට ඇතිවන බාධා මොනවාද?

........................................................................................................................................

4. එකම දෙවියන් වහන්සේ කෙරෙහි පමණක් අදහන්නට බලය ඉල්ලා යාච්ඤාවක් ලියන්න.



........................................................................................................
........................................................................................................
........................................................................................................
........................................................................................................



**8 වන ශ්‍රේණිය - 4 වන පාඩම**

# එලියා බලවත් කළ  දෙවියන් වහන්සේ

**බයිබල් කොටස : 1 රාජාවලිය 19: 1-18**

**කටපාඩම් පදය:**

**මා බලවත් කරන තැනන් වහන්සේ තුළ මට සියලු දේ කළ හැකිය.**

**(පිලිප්පි 4:13)**



**හැඳින්වීම:**

දුර්වලකමේදී දෙවියන් වහන්සේ අප බලගන්වමින් සුරකින බව විශ්වාස කිරීමට මෙය කදිම උදාහරණයකි. එලියා දෙවියන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන විශ්වාසය තබමින් බාල් දෙවියන්ගේ දිවැසිවරුන් පරාජය කිරීමට තරම් ඔහුගේ ඇදහිල්ල බලවත් විය. එසේ වුවද ජෙසබෙල් රැජින සහ අහබ් රජුගේ තර්ජන ඉදිරියේ ඔහු බෙයර්ෂෙබාට පලා ගියේය. මෙම ගමනේදී දෙවියන් වහන්සේ එලියාට උපකාර කළ ආකාරය  සහ දින හතලිහක් ගමන් කර හොරෙබ් කන්දට ගමන් කළ ආකාරය බයිබලය කියවා දැනගන්න.

1. ඔබේ ජීවිතයේ හෝ ඔබගේ පවුල තුළ අමාරු අවස්ථාවකදී දෙවියන් වහන්සේ ඔබට උපකාර කළ ආකාරය ගැන සිහි කරමින් ලියන්න.

   ........................................................................................................................................

   ........................................................................................................................................

2. ඔබට අමාරු යැයි සිතෙන දේවල් මොනවද?

   ........................................................................................................................................

   ........................................................................................................................................

3. අපගේ ඇදහිල්ල සෙලවෙන  අවස්ථාවේදී ද දෙවියන් වහන්සේ අප සමග සිටින සේක. අප අත් නොහරින සේක. මෙම වැකිය ඔබගේ යහලුවෙකුට හෝ යෙහෙළියකට ඔබ තේරුම් කර දෙන්නේ කෙසේද?

   ........................................................................................................................................

   ........................................................................................................................................

**8 වන ශ්‍රේණිය - 5 වන පාඩම**



# එලිෂා දිවැසිවරයා කළ හාස්කම් කිහිපයක්

**බයිබල් කොටස: 2 රාජාවලිය 4 වන පරිච්ඡේදය**

**කටපාඩම් පදය : මට යාච්ඤා කරන්න, එවිට මම නුඹට පිළිතුරු දී නුඹ නොදන්න, සැඟවී ඇති, වැදගත් සත්‍යයන් නුඹට දන්වන්නෙමි. (ජෙරමියා 33:3)**

**හැඳින්වීම :**

2 රාජාවලිය 4 වන පරිච්ඡේදය සම්පූර්ණයෙන් කියවීමෙන් එලිෂා කළ හාස්කම් කිහිපයක් ඔබට කියවීමට හැකියාව ලැබෙන අතර ඒ තුළින් දෙවියන් වහන්සේගේ පුදුම බලය කෙරෙහි ඔබට දැනගැනීමට හැකිවනු ඇත. එලිෂා, එලියා දිවැසිවරයාගේ ගෝලයෙකි. එලියාට මෙන් දෙගුණයක් ආත්මය ලැබෙන පිණිස තමාට ආශීර්වාද කරන්නැයි එලිෂා, එලියා දිවැසිවරයාගෙන් කළ ඉල්ලීම එලියා දිවැසිවරයා ඉටු කළේය. මෙම බයිබල් කොටස කියවීමෙන් ඔබට පහත සඳහන් හාස්කම් කිහිපය පිළිබඳව දැනගැනීමට හැකිය.

1. වැන්දඹුවගේ තෙල් කුළාව
2. ෂුනම්මිය ස්ත්‍රියට ත්‍යාගයක්
3. මිය ගිය දරුවෙකුට පණ දීම.
4. සැලියේ මරණයෙන් ගළවා ගැනීම.
5. ආහාර පිළිබද ප්‍රාතිහාරය.

**පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**

1. දිවැසිවර එලිෂාට, වැන්දඹු ස්ත්‍රිය ළඟ තිබුණා යැයි කිවේ මොනවද?

..........................................................................................................................................

2. දිවැසිවරයා විසින් ඈගෙන් කුමක් කරන ලෙස ඉල්ලුවේද?

..........................................................................................................................................

3. ස්ත්‍රිය තම ණය මුදල බේරනු ලැබුවේ කෙසේද?

..........................................................................................................................................

4. එලිෂා දෙවියන් වහන්සේගෙන් ඉල්ලා ෂුනම්මිය ස්ත්‍රියට ලබාදුන් ත්‍යාගය කුමක්ද?

..........................................................................................................................................

5. ෂුනම්මිය ස්ත්‍රියගේ පුත්‍රයාට කළ හාස්කම කුමක්ද?

..........................................................................................................................................

6. ආහාරයේ වස ඇතිවිට දිවැසිවරයා කුමක් කළේද?

..........................................................................................................................................

7. මනුෂ්‍යයන් 100 ඉදිරියට ගෙනෙන ලද යව රොටි විස්ස සහ ගොයම් කරල් කිහිපයට දිවැසිවරයා කළේ කුමක් ද?

..........................................................................................................................................

**ජීවිතයට යමක්**

1. ඔබගේ ජීවිතයේ සියල්ල දෙවියන් වහන්සේගේ දෙනෙතට පෙනෙන බව ඔබ විශ්වාස කරන්නේද?

2. ඔබගේ ජීවිතයේ අත්දැක ඇති පුදුම දෙයක් මෙනෙහි කර, එම අත්දැකීම කෙටියෙන් විස්තර කරන්න.

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය



8 වන ශ්‍රේණිය - 06 වන පාඩම

# ඉශ්‍රායෙල් හී රාජ්‍යය දෙකඩ වීම.

**බයිබල් කොටස : 1 රාජාවලිය 12: 1- 17**

**කටපාඩම් පදය :**

"මගේ පුත්‍රය" විචක්ෂණ බුද්ධියද තීක්ෂණ ඥාණයද දියුණු කරගන්න. ඒවා ඔබ කෙරෙන් පහව යන්න ඉඩ නොදෙන්න."

**හිතෝපදේශ 3:21**

සිතියම

## හැඳින්වීම:




දෙවියන් වහන්සේ ආබ්‍රහම්ගෙන් පැවත එන්නන් තම තෝරාගත් ජාතිය බවට නම් කළ අතර, ඔවුන් මිසර දේශයෙන් මුදවාගෙන කානාන් දේශයට ගෙනෙවිත් රජවරුන් 03 දෙනෙකු යටතේ එක් රාජ්‍යයක් ලෙස ගෙන ආ සේක. එහෙත් සලමොන් රජුගෙන් පසු මේ රාජ්‍යයන් තවත් එකක්ව නොව දෙකක් ලෙස බෙදී වෙන්විය. සලමොන් රජුගෙන් පසු රෙහෙබෝවම් රජ කමට හිමිකම් කීය. ප්‍රජා මූලිකයන් රෙහෙබෝවම් රජුට යහපත් පාලනයකට ඇතුල් වන පිණිස උපදෙස් දුන්නද ඒ හඬට අකීකරු වී තමන්ගේ වයසේ තරුණයන්ගේ හඬට කීකරු වී අයහපත් දරුණු පාලනයක් ගෙන යෑම රාජ්‍යය දෙකඩවීමට මූලික විය. මෙය ජනතාවගේ බලාපොරොත්තු සුන්වීමක් විය.

උතුරු රාජධානියේ අගනුවර සමාරිය වූ අතර දකුණු රාජධානියේ අගනුවර ජෙරුසලම විය. ඉශ්රායෙල් ගෝත්‍ර 12 න් 10 උතුරු රාජ්‍යයට අයිති විය. ජුදා සහ බෙන්ජමින් ගෝත්‍ර දෙක අයිති වූයේ දකුණු රාජධානියටය. නමුත් දෙවියන් වහන්සේ දාවිත්ට දුන් පොරොන්දුවේ ප්‍රකාරයටම දකුණු රාජ්‍යය තුළ ඔහුගේ පරපුරේ රාජකීයත්වය දිගටම දරන ලදී.

## 1 රාජාවලිය 12: 1- 17 ,බයිබල් කොටස කියවා ප්‍රෙහේලිකාව පුරවන්න

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1අ | | | | 4දා | | | | 5 |
| | | | | | | | | කු |
| 7 | | | | | 8උ | | | |
| | | | | | | | 6 | |
| 2 ස | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | 3 | | | | | | ත් | |

**පහළට**

5. ජුදා සහ බෙන්ජමින් ගෝත්‍ර අයත් වුයේ කුමන රාජධානියට ද?
6. ඉශ්‍රායෙල් වරුන්ගේ රාජ්‍යය දෙකඩ වීමට මූලික හේතුව වූයේ රජු ……….. ගෙන් උපදෙස් ගත් නිසාය.
7. දකුණු රාජධානියේ අගනුවර වූයේ කුමන නගරය ද?
8. ගෝත්‍ර 12 න් 10 ක් ම අයත් වූයේ මෙම රාජධානියටය

**හරහට**

1. දෙවියන් වහන්සේ තම තෝරා ගත් ජාතිය ලෙස නම් කළේ කවරෙකුගෙන් පැවත එන්නන් ද?
2. උතුරු රාජධානියේ අගනුවර වුයේ කුමන නගරය ද ?
3. රෙහෙවබ් රජුට නිවැරදි උපදෙස් දීමට උත්සහ කළේ කුමන පිරිසද?
4. සලමොන් රජුගේ පියාගේ නම කුමක් ද?

**ජීවිතයට යමක්**

1. නායකයෙකු ලෙස තීරණ ගැනීමේදී දෙවියන් වහන්සේට යාච්ඤා කිරීම සහ උන්වහන්සේගේ හඬට සවන්දීම.

2. සේවය කිරීමේදී සේවක ආත්මයෙන් සේවය කිරීම.

3. තීරණ ගැනීමේදී දේව වචනයට අනුව තීරණ ගැනීම.

4. අන් අයගේ උපදෙස් පැතිමේදී නිවැරදි තීන්දු ගැනීමට හැකි වන ලෙස නිවැරදි පුද්ගලයන් සමග සාකච්ජා කිරීම.



**8 වන ශ්‍රේණිය - 07 වන පාඩම**

# දේව කැඳවීමට කීකරුවීමේ අවශ්‍යතාවය තේරුම් ගැනීම

**බයිබල් කොටසඃ යෙසායා 6:1-6**

**කටපාඩම් පදය :**

ඇදහිල්ල නැතිව උන්වහන්සේගේ ප්‍රසාදය දිනාගැනීමට පුළුවන්කමක් නැත. මන්ද දෙවියන් වහන්සේ වෙත ළඟා වන්නා උන්වහන්සේ ජීවත් වනබවත්, උන්වහන්සේ සොයා එන්නවුන්ට ඉෂ්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කළ යුතුය. **හෙබ්‍රෙව් 11:6**

**හැඳින්වීම** :දෙවියන් වහන්සේ තම සේවයට දිවැසිවරුන් තෝරා ගැනීමේදී විවිධ ක්‍රම භාවිත කළසේක. උන්වහන්සේ යෙසායා දර්ශනයක් මගින් ඇමතීය. දෙවියන් වහන්සේගේ තේජස දුටු විට යෙසායා තමන්ගේ නොවටිනාකම ගැන තේරුම් ගත්හ. දෙවියන් වහන්සේ දුටු කෙනෙකු තවත් ජීවත්වන්නේ නැතැයි විශ්වාසයක් ඉශ්රායෙල්වරුන් අතර තිබු බැවින් යෙසායා සැබවින්ම බිය විය. තමාගේ වැරදි අඩුපාඩුකම් ගැන තමාගේ අපවිත්‍ර තොල් ගැන පිළිගත්හ.

සෙරාප්වරු යනු දෙවියන් වහන්සේගේ අභියස සිටි දූතයන් සේ බයිබලය හඳුන්වයි. සෙරාප්වරු යෙසායා වෙත පැමිණ ඔහුගේ මුඛය තුලට ගිනි අඟුරු කැබැල්ලක් දමා ඔහුගේ මුඛය පිරිසිදු කරමින් ඔහුගේ පාපයට කමාව ලබා දුන්නේය. දෙවියන් වහන්සේ යෙසායා කැඳවනු ලැබූ අවස්ථාවේ ඔහු සිය කැමැත්තෙන්ම කීකරු විය.

1. දෙවියන් වහන්සේ ඔබට කතා කරන විවිධ ක්‍රම මොනවද?
   ..........................................................................................................
   ..........................................................................................................
   ..........................................................................................................
2. දේව කැමැත්තට කීකරු වීමට ඔබට බාධා වන කාරනා මොනවාද ?
   ..........................................................................................................
   ..........................................................................................................
   ..........................................................................................................
3. ඔබ ඔබගේ පාපය ගැන දන්නවාද ? එම පාපයට කමාව ඉල්ලා යාච්ඤා කරන්න.
   ..........................................................................................................
   ..........................................................................................................
   ..........................................................................................................





## 8 වන ශ්‍රේණිය - 08 වන පාඩම

# ජෙරමියා දිවැසිවරයාගේ සේවය

**බයිබල් කොටස : ජෙරමියා 1:1-19 ; 38:1-13**

කටපාඩම් පදය: **එහෙයින් අන්ධකාරයෙන් ස්වකීය අලෝකයට ඔබ කැඳවාගත් තැනන් වහන්සේගේ මහිමාන්විත ක්‍රියා දන්වනු පිණිස ඔබ වනාහී තෝරාගත් වංශයක්ද රාජකීය පූජක පෙළපතක්ද ශුද්ධ ජාතියක්ද දෙවියන් වහන්සේ සතු සෙනගක්ද වන්නහුය.** (1 පේදුරු 2:9)

**හැඳින්වීම:** ඔබ ළඟ මැටි පිඩක් හෝ ක්ලේ (Clay) ටිකක් ඇතිනම් එය භාවිතකොට පුංචි නිර්මාණයක් කිරීමට උත්සාහ කරන්න. නැතිනම් පාන්පිටි ටිකක් වතුර ටිකකින් අණා පුංචි පිටි ගුලියක් සදාගෙන වුව ද යමක් නිර්මාණය කළ හැකිය. එය සිදු කිරීමේදී මෙම පියවරයන් අනුගමනය කරන්න.

1. ඔබ නිර්මාණය කරන්නේ කුමක්දැයි තීරණය කරන්න.

2. හෙමින් සීරුවේ මැටි ටික, ක්ලේ (Clay) ටික හෝ පිටි ටික අතින් තද කරමින් ඔබගේ නිර්මාණය කරන්න උත්සහ කරන්න.

3. කී වාරයක් ඔබ එය නැවත නැවත ගුලිකරමින් නිර්මාණය කරන්න මහන්සි වෙන්න උත්සහ කළේදැයි සිතන්න.

**දෙවියන් වහන්සේ ජෙරමියා තෝරාගන්නා විට මෙසේ පවසයි. ඔහුගේ මවු කුසේ පිළිසිඳ ගැනීමටත් පෙර දෙවියන් වහන්සේ ඔහුව හඳුනන බව, ඔහුගේ උපතට පෙර ඔහු කැපකළ බව, හා ජාතීන් හට දිවැසිවරයෙකු ලෙස ඔහුව පත් කළ බව . එහෙත් ජෙරමියා තමා බාලයෙකු බවත් කථා කිරීමට නොහැකියි කියමින් දේව කැඳවීමට පිටුපාන්න උත්සහ කළේය. එහෙත් දෙවියන් වහන්සේ විසින් කැඳවනු ලැබුවන් උන්වහන්සේ විසින් ගෙන යන බව පසක් කරමින් ජෙරමියා ද අවසානයේ දේව හඬට කීකරු විය.**
**ජෙරමියා නිර්භීතව දේව වචනය ප්‍රකාශ කිරීම නිසා ඔහු රාජ්‍යය නායකයන්ගේ උදහසට ලක්විය. එහෙත් දෙවියන් වහන්සේ ඔහු සමග සිටි බැවින් ඔහු නිර්භයව තම කාර්යයේ නිරත විය.**
(ජෙරමියා 38:1-13 ට කියවන්න.)

**ජීවිතයට යමක්**

1. සෑම කෙනෙකුම මව් කුසේ පටන් විවිධ සේවාවන් වලට තෝරාගෙන ඇත. එලෙසෙම ඔබව ද දෙවියන් වහන්සේ තෝරාගෙන ඇති බව අමතක නොකරන්න.

2. අපගේ ජීවිත දෙවියන් වහන්සේගේ දෑතට බාර කර උන්වහන්සේගේ සේවයට කැපකරගන්නා ලෙස යාච්ඤා කරන්න.

3. ඔබට දැනටමත් දේව සේවයට යෑමේ හදවතක් ඇතිනම් අදම පමා නොවී ඒ බව ඔබගේ දෙමව්පියන්ට දන්වා දේවගැතිතුමා දැනුවත් කරන්න.

4. ඔබගේ හදවත තුළ දැල්වෙන ඒ ආත්මික ගින්න කිසිවිටකත් නොනිවෙන පිණිස යාච්ඤා කරන්න.

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය



8 වන ශ්‍රේණිය - 09 වන පාඩම

# සුන් වූ බලාපොරොත්තු දෙවියන් වහන්සේ පණගන්වන සේක

**බයිබල් කොටසඃ එසකියෙල් 37ඃ 1-14**

**කටපාඩම් පදය :එපමණක් නොව, පීඩා විඳීමෙන් ඉවසිල්ල ද, ඉවසිල්ලෙන් තැන්පත් බව ද, තැන්පත් බවෙන් බලාපොරොත්තුව ද උපදින බව දැන, අප විඳින පීඩා වලදී වුවද, අපි ප්‍රීති ප්‍රමෝද වෙමු.**

**(රෝම 5ඃ 3-4)**

**හැඳින්වීමඃ** බලාපොරොත්තු රහිතව ජීවත්ව සිටි ජනතාවට පණිවිඩයක් ගෙන ඒමට එසකියෙල් දිවැසිවරයා දේවාත්මානුභාවයෙන් පිරී ගියේය. ඇට කටුවලින් පිරුණු මිටියවතකට එසකියෙල් දිවැසිවරයා ගෙන ගිය දෙවියන් වහන්සේ, ඇටකටු වලට දිවැස්වැකි කියන පිණිස අණ කරයි. එම ඇටකටුවලට  නහර දෙමින්, මාංශය හටගන්වා, සමෙන් වසා , ජීවත්වන පිණිස ජීවන හුස්ම හෙළීම සඳහා එසකියෙල්ට අණ ලැබිණි. ඔහු එසේ කළ පසු ජීවන හුස්මට දිවැස් වැකි කියා ඇටකටු වලින් මහා සෙනගක් සිටගැන්විය.

■ දෙවියන් වහ්සේ ඔබට ලබා දුන් ජයග්‍රහණයක්  පිළිබඳ ප්‍රශංසා කොට පද කිහිපයකින් යුත් කවියක් නිර්මාණය කරන්න.



............................................................................................

............................................................................................

............................................................................................

............................................................................................

............................................................................................

............................................................................................

............................................................................................

**ජීවිතයට යමක්**

1. බලාපොරොත්තු නැති තැන බලාපොරොත්තු ඇති කිරීමට දෙවියන් වහන්සේට හැකිය.
2. ඒ සඳහා දෙවියන් වහන්සේ මනුෂ්‍යයන් කැඳවන සේක.
3. ඔබගේ ජීවිතයේ බලාපොරොත්තු නැති වූ අවස්ථාවන් මොනවද?
4. ඒවාට පිළිතුරු සොයා ඔබ යන්නේ කව්රුන් වෙතද?
5. ජීවිතයේ බලාපොරොත්තුවක් නොමැති කෙනෙකු ඔබට මුණ ගැසුනොත් ඒ අයට ඔබ උදව් කරන්නේ කෙසේද?



8 වන ශ්‍රේණිය - 10 වන පාඩම

# පරිසරය අලංකාර කර ගැනීම උදෙසා කාලය වැය කිරීම

## බයිබල් කොටසඃ උත්පත්ති 1:28

**හැඳින්වීමඃ**

දෙවියන් වහන්සේ අප විවිධ සේවාවන් උදෙසා කැඳවන බව පසුගිය පාඩම් වලින් අපි ඉගෙනගනු ලැබුවෙමු. උන්වහන්සේ මුලින්ම මිනිසා කැඳවන්නේ උන්වහන්සේ විසින් මවන ලද ලෝකය ආරක්ෂා කර ගැනීමටය. එය රැකබලා ගනිමින් වර්ධනය කිරීම අපි සැමගේ වගකීම වේ. විශේෂයෙන් අපි වැඩි හරියක් නිවසට වී සිටින මේ කාලයේදී දෙවියන් වහන්සේ කර ඇති කැඳවීමට කීකරු වීමට අවස්ථාවක් උදාකර ගනිමින් පහත සඳහන් යම් කාර්යයක නිරත වෙමු.





දැනුම පොතටඃ

- ❖ **ලෝක පරිසර දිනය (උඃ) සෑම වසරකම ජූනි 5 වන දින සමරනු ලබන අතර, එය අපගේ පරිසරය ආරක්ෂා කිරීම සඳහා දැනුවත් කිරීම සහ ක්‍රියා කිරීම දිරිගැන්වීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ මූලික ප්‍රවාහය වේ. 1974 දී ප්‍රථම වරට පවත්වන ලදි.**

- ❖ **මෙහිදි පාරිසරික ගැටළු වන,**
  **සමුද්‍ර දූෂණය, මානව ජනගහනය සහ ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම, තිරසාර පරිභෝජනය සහ වනජීවී අපරාධ පිළිබඳව දැනුවත් කිරීම සඳහා වන ප්‍රධාන ව්‍යාපාරයකි.**

- ❖ **ලෝක පරිසර දිනය වාර්ෂිකව රටවල් 143 කට අධික සංඛ්‍යාවක සහභාගීත්වයෙන් සමරයි**

**<u>ක්‍රියාකාරකම්</u>**



1. ඔබේ ගෙවත්ත පිරිසිදු කිරීමට කාලයක් යොදවන්න.

2. ඔබේ ගෙවත්තේ ඉඩ පහසු තියෙන ආකාරයට පැල කිහිපයක් සිටුවන්න හැකි ලෙස සකසා ගන්න.

3. ප්ලාස්ටික්, පොලිතින් වැනි දේ භාවිතය අවම කරගැනීමට හැකි වන ලෙස ජිවිත ක්‍රමය හුරුකරගන්න පුරුදුවීමට ක්‍රියා කරන්න.

4. ඔබගේ නිවාස පිරිසිඳු කර එය පිළිවෙලකට සකසාගන්න.

5. ඔබේ නිවාස කොතරම් ලොකු වුවද, කුඩා වුවද අපේම ඇඳුම් තිබෙන ස්ථානය, පොත් රාක්කය හෝ මේසය පිරිසිදුවට තබා ගැනීමට පුරුදු වීම අත්‍යවශ්‍ය කරුණකි. අද දවසේ උදය වරුව ඔබ යම් පිරිසිඳු කිරීමේ ක්‍රියාවලියකට යොමු වීම වැදගත් කොට සළකා යම් කටයුත්තක නිරතවෙන්න.

**අපට දී ඇති ලස්සන ලෝකය ගැන ස්තුති කර යාච්ඤාවක් ලියන්න.**

සැකසුමඃ ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය

8 වන ශ්‍රේණිය - 11 වෙනි පාඩම

# සැත්තෑදෙනා සේවයට පිටත් කර යැවීම.



**බයිබල් කොටසඃ- ශු. ලූක් 10ඃ 1-12**

කටපාඩම් පදයඃ **"ගොයම නම් බහුලය. ගොවීහු විරලය. එබැවින් ගොයම් කැපීමට මෙහෙකරුවන් එවන මෙන් හිමියාණන්ට යාච්ඤා කරන්න."**

(ශු. ලූක් 10 ඃ 2)

- ජේසුස් වහන්සේ සැත්තෑ දෙනා යවන ලද්දේ කෙසේ ද?
  ......................................................................................................................................
- ගොයම නම් බහුලය ගොවීහු විරලය යනුවෙන් ජේසුස් වහන්සේ අදහස් කළේ කුමක් ද?
  ......................................................................................................................................
- සැත්තෑ දෙනා පිටත් කර හරින ලද්දේ කුමක් ප්‍රකාශ කිරීමට ද?
  ......................................................................................................................................
- ජේසුස් වහන්සේ විසින් සැත්තෑ දෙනාට පිළිපැදීමට දුන් උපදෙස් කවරේද?
  ......................................................................................................................................
  ......................................................................................................................................
  ......................................................................................................................................
  ......................................................................................................................................
- කිතුනු මෙහෙවර පිළිබඳ ඔබට ඇති අදහස පැහැදිලි කරන්න.
  ......................................................................................................................................
- දෙවියන් වහන්සේට සේවය කිරීම සඳහා ඉතා දුෂ්කර පලාතකට යාමට ඔබට සිදුවේ යැයි සිතන්න. ඒ සඳහා ඔබට රැගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍ය වන්නේ මොනවා ද?

සිතන්නට යමක් :-

අනාගතයේ දී, ඔබ ජේසුස් වහන්සේගේ සේවය සඳහා පිටත්ව යාමට සූදානම් ද?

❖ **දෙවියන් වහන්සේට සේවය කිරීමටත් උන් වහන්සේ ගැන අන් අයට සාක්ෂි දැරීමට ත් හැකියාව ලබා දෙන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.**



## 8 වන ශ්‍රේණිය - 12 වෙනි පාඩම

# ඔබ ක්‍රිස්තුවරයාණෝය (මෙසියස් වහන්සේය)

### බයිබල් කොටස :- ශු. මතෙව් 16: 13 - 20

කටපාඩම් පදය: **සීමොන් පේදුරු උත්තර දෙමින්, " ඔබ ක්‍රිස්තුවරයාණෝය, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය. " යි කීය.**

**(ශු. මතෙව් 16: 16)**

- ජනතාව විසින් ජේසුස් වහන්සේ හඳුනාගනු ලැබුවේ කවර තැනැත්තන්ගේ නම් වලින් ද? සඳහන් කරන්න.

 ………………………………………………………………………………………………………………………..

- **පිළිතුරු ගළපා යා කරන්න.**

| | |
|---|---|
| ✓ ජනතාව ජේසුස් වහන්සේ මෙලෙස හැදින් විය | ජෝනා |
| ✓ ජේසුස් වහන්සේ පේදුරුව හඳුන්වනු ලැබුවේ | සීමොන් පේදුරුට |
| ✓ පාතාලයේ දොරටු වලට වුව ද පරාජය කල නොහැකි වන්නේ | ඔබ මාගේ ක්‍රිස්තුවරයාණෝය |
| ✓ පේදුරු තුමාගේ  පියාගේ නම | ඔබ මාගේ පර්වතයයි |
| ✓ පේදුරු විසින් ජේසුස් වහන්සේ ව හඳුන්වනු ලැබුවේ | ක්‍රිස්තුස් වහන්සේගේ සභාව |
| ✓ ජේසුස් වහන්සේ විසින් ස්වර්ග රාජ්‍යයේ යතුරු බාර දෙන ලද්දේ | දිවැසිවරයෙක් |

**සැබැවින්ම ඔබ ජේසුස් වහන්සේ ව හඳුනා ගත්තා ද? එසේ නම් උන් වන්සේව අන් අයට හඳුන්වා දීමට ඔබ සූදානම් ද?**

- ජේසුස් වහන්සේ විසින් පවරන වගකීම් උසුලා ගැනීමට ඔබ සූදානම් වන්නේ කෙසේ ද?
- ඔබගේ නිවසේ දී, දේවස්ථානයේදී, දහම් පාසලේ දී, දින පාසලේ දි ඔබට ලැබෙන වගකීම් ඔබ ඉටු කරන්නේ කෙසේද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

❖ **ජේසුස් වහන්සේ නිවැරදි ලෙස හඳුනා ගැනීමටත් , උන් වහන්සේ වෙනුවෙන් වගකීම් ගැනීමටත් පුහුණු කරන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.**



8 වන ශ්‍රේණිය - 13 වෙනි පාඩම

# මීමැස්මොර රෝගී දරුවෙකු සුවය ලබයි.

**බයිබල් කොටස :- මාර්ක් 9: 14 -29**

**කටපාඩම් පදය: "ඇදහිල්ල වනාහි බලාපොරොත්තු වන දේ පිළිබඳ සහතිකයයි. අදෘශ්‍යමාන දේ පිළිබඳ නිසැක කමයි."**

**(හෙබ්‍රෙව් 11:1)**

- මෙහි එන දරුවාගේ පියාට ඇදහිල්ල පිළිබඳව ජේසුස් වහන්සේ පැවසුවේ කුමක් ද?

  ..............................................................................................................................

- මෙම බයිබල් කතාවට අනුව ඇදහිල්ල පිළිබඳව ඔබ ඉගෙන ගත් දෙය ලියන්න.

  ..............................................................................................................................

- ඇදහිල්ල තුළින් ඔබ ලැබුවා වූ අත්දැකීමක් ලියන්න.

  ..............................................................................................................................

- ජේසුස් වහන්සේ තම ගෝලයන්ට පැවසු ආකාරයට සාතන් නැමැති යක්ෂයාව පරාජය කළ හැකි හොඳම ක්‍රමය කුමක්ද?

  ..............................................................................................................................

මෙම ගීතිකාව ගායනා කරන්න.

**"අදහන්න ස්වාමි තුළ**

**පුදුම ආසිරි සිදුවෙයි දැන්**

**ඔබගේ ඇදහිල්ලෙන් "**



**යාච්ඤා කිරීම සඳහා ඔබට ගැටළුවක් එනතුරු නොසිටින්න. දිනපතා යාච්ඤාවේ යෙදෙන්න. නමුත් මතක තබා ගන්න, උන්වහන්සේ නිරන්තරයෙන් ඔබට ලබා දෙන්නේ ඔබට අවශ්‍ය දෙයම නොව ඔබට සුදුසු දෙය බව**

**දෙවියන් වහන්සේට සියල්ල කළ හැකිය. උන් වහන්සේ දුන් සියලු ආශිර්වාද වලට ස්තුති කරමින්, උන් වහන්සේ කෙරෙහි වඩවඩාත් විශ්වාසයෙන් සිටීමටත් හැකියාව ඉල්ලා යාච්ඤා කරන්න.**



8 වන ශ්‍රේණිය - 14 වෙනි පාඩම

# කිරිඳි පිළිබඳ උපමාව



**බයිබල් කොටස : මතෙව් 13: 24-30, 36-40**

**කටපාඩම් පදය : " පව්ටුන් ආදර්ශයට නොගන්න. දිවා රෑ දෙකෙ හී සමිඳුන්ට ගරු බිය දක්වන්න. එසේ කළොත් ඔබට අනාගතයක් ඇත. දීප්තිමත් අනාගතයක් වනු ඇත."**

**(හිතෝපදේශ 23: 17 -18)**

තිරිඟු වගා කළ ගොවියෙකුගේ කතාවක් ජේසුස් වහන්සේ පවසයි. රාත්‍රියේ දි සතුරෙක් පැමිණ ගොවියාගේ වගාව විනාශ කිරීමේ අදහසින් තිරිඟු අතර කිරිඳි (වල් පැළෑටි) රෝපණය කරයි. ගොවියාගේ සේවකයන්ට වල් පැළෑටි උදුරා දැමීමට අවශ්‍ය වූවත් ගොවියා පැවසූවේ අස්වැන්න නෙළන තෙක් ඒවා එකට වැඞීමට ඉඩ දෙන්න යනුවෙනි.

- තිරිඟු අතර කිරිඳි වැඩෙන්නට ඉඩ හැරියේ කුමක් නිසා ද? පැහැදිලි කරන්න.

  .......................................................................................................................

  .......................................................................................................................



- ස්වර්ග රාජ්‍ය සමාන වන්නේ කුමකට ද?


  ........................................................................................................................................................

- **හිස්තැන් වලට සුදුසු පිළිතුර වෘත්තයෙන් තෝරා ලියන්න**


1. ගොවියා නම් ............................
2. හොඳ බීජ වපුරන තැනැත්තා.......................
3. හොඳ බීජ නම්..........................
4. කිරිඳි නම්.................................
5. නපුර වපුළ සතුරා නම්........................
6. කපන කාලය.............................
7. කපන්නෝ.................................

දේව දූතයෝය
යක්ෂයා
ලෝකය
රාජ්‍යයට අයිති අය
දෙවියන් වහන්සේය
මනුෂ්‍ය පුත්‍රයාණෝය
යුගාන්තය

- ඔබට වැපිරීමට ඇති යහපත නැමැති තිරිඟු කෙතෙහි පැළකරන්න (රූපයෙහි ඇති වළවල් මත ලියන්න).



- ඔබට ඇති අයහපත් දේ කපා මිටි බැඳ ගිනි මැලයට දමන්න.



යහපත සහ අයහපත වෙන්කර හඳුනා ගැනීමටත්, යහපත සියල්ලන් වෙත වැපිරීමටත් අයහපත් දේ අපගේ ජීවිතයෙන් ඉවත් කර ගැනීමටත් හැකියාව ලබා දෙන ලෙස ඉල්ලා දෙවියන් නමදින්න.



**8 වන ශ්‍රේණිය - 15 වෙනි පාඩම**

# අබ ඇටය සහ මුහුන්



**බයිබල් කොටසඃ- ශු.මතෙව් 13ඃ 31-33**

**කටපාඩම් පදයඃ "අපගේ ස්වාමීන් ද ගැළවුම්කාරයාණන් ද වන, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වරප්‍රසාදයෙහි ද උන් වහන්සේ දැනගැන්මෙහි ද වැඩි වර්ධනය වෙන්න."**

**(2 පේදුරු 3ඃ 18)**

- ඔබ අබ ඇටයක් දැක තිබේනවා ද? එම කුඩා අබ ඇටය විශාල ගසක් වීම, නැතිනම් මුහුන් පිඩකින් පිටි නැලි 3ක් සහමුලින්ම පිපීමෙන් අදහස් කරන්නේ කුමක් ද?

  ..................................................................................................................................

  ..................................................................................................................................

- දේව රාජ්‍යය වෙනුවෙන් ඔබට කළ හැකි ඉතා කුඩා දෙයක් ලියන්න.

  ..................................................................................................................................

  ..................................................................................................................................

- ඔබ කරන කුඩා දේවල් වැදගත් නොවන බවට වූ ඔබගේ ආකල්පය ඔබ වෙනස් කරගන්නේ කෙසේද?

  ..................................................................................................................................

  ..................................................................................................................................

**දේව රාජ්‍යයෙ වර්ධනය සඳහා දායක වීමට හැකියාව ලබා දෙන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.**

• ඔබ කුඩා කල සිට වැඩෙන්නේ කුමනාකාරයේ ගසක් වීමට ද? පැහැදිලි කරන්න





## 8 වන ශ්‍රේණිය - 16 වෙනි පාඩම

# පොහොසත් තරුණයා

**බයිබල් කොටසඃ ශු. මාක් 10 : 17 - 31**

**කටපාඩම් පදයඃ" ස්වාමිවරු දෙදෙනෙකුට මෙහෙවර කිරීමට කිසිවෙකුට නුපුළුවන. මන්ද, ඔහු එක් කෙනෙකුට වෛර බැඳ අනික් අයට ප්‍රේම වන්නේය. නැතහොත් එක් කෙනෙකුට ළැදි වී, අනික් අය හෙළා දකින්නේය. දෙවියන් වහන්සේට සහ වස්තුවට සේවය කරන්න ඔබට නොහැකිය."**

**(ශු. මතෙව් 6 : 24)**

- "**මා යහපත් යැයි ඔබ කියන්නේ මන්ද**" යනුවෙන් ජේසුස් වහන්සේ ධනවත් තරුණයාගෙන් ප්‍රශ්න කරයි. එම ප්‍රශ්නය එතුමා ඔබගෙන් ඇසුවොත් ඔබගේ පිළිතුර කුමක් විය හැකි ද?

  ..............................................................................................................................................

- ධනවතුන්ට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වීමට දුෂ්කර බව පහදා දීම සඳහා ජේසුස් වහන්සේ යොදාගත් උපමාව කුමක් ද?

  ..............................................................................................................................................



- දෙවියන් වහන්සේ ඔබට යමක් අත්හැරීමට පැවසුවොත් ඔබ එය අත්හැරීමට සූදානම් ද?

  ..............................................................................................................................................

- **වරහන් තුළින් පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

ජේසුස් වහන්සේ වෙත තරුණයකු ..................... (දුවගෙන/ඇවිදගෙන) ආවේය. සදාතන ජීවනය උරුම කරගැනීම පිණිස මම කුමක් .................... (කිව යුතුද/කළ යුතුද) තරුණයා ජේසුතුමාගෙන් ඇසුවේය. ජේසුස් වහන්සේ කතා කොට..................... (මිනිසුන්/දෙවියන් වහන්සේ) යහපත් යැයි කියන දේ කරන්නැයි පැවසීය. තරුණයා ද දැනටමත් මම එය ................... (කරනවා/ බලනවා) යැයි කීවේය. එහෙත් ඔබට තව ............................ (එක් අඩුපාඩුවක්/අඩුපාඩු දෙකක්) ඇතැයි ජේසුස් වහන්සේ ඔහුට පැවසුවේය. එනම් ඔහු සියල්ල ..................... (අත්හැරිය/මිලදී ගත) යුතු බවයි. එමෙන්ම තරුණයා ඔහුගේ ධනය ....................... (ධනවතුන්ට/දිළිඳුන්ට) දිය යුතු බවයි. එය ඇසූ තරුණයා බොහෝ ........................ (දුකට/සතුටට) පත් විය. අවසානයේ දි තරුණයා ජේසුස් වහන්සේ ...................... (පසු පස යාමට/අත්හැරීමට) තෝරා ගත්තේය.



❖ ඔබ දෙවියන් වහන්සේට යාච්ඤා කරන්නේ කෙසේ ද?
මාව සමත් කරන්න, මගේ ලකුණු වැඩි කරන්න. මට මුදල් දෙන්න යනුවෙන් ද?
ඔබ කවදා හරි ඉල්ලා තිබේනවා ද? මා යහපත් අයෙකු කරන්න, අන් අයව ප්‍රීතියෙන් තැබීමට ඔවුන්ට යහපත කරන්න මට හැකියාව ලබා දෙන්න කියා එසේ නම් අද සිට එය ඉල්ලා යාච්ඤා කරන්න.



## 8 වෙනි ශ්‍රේණිය - 17 වෙනි පාඩම

# සැබෑ මිදි වැල

**බයිබල් කොටස : ශු. ජොහාන් 15 : 1- 17**

කටපාඩම් පදය: **"එමෙන්ම මිනිසුන් ඔබේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි වැඩසිටින ඔබේ පියාණන් වහන්සේට ප්‍රශංසා කරන පිණිස ඔබේ ආලෝකය ඔවුන් ඉදිරියෙහි බබළවන්න."** (ශු. මතෙව් 5: 16)

ප්‍රේහේලිකාව පුරවන්න. (පිළිතුරු වෘත්තය තුළින් තෝරන්න)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 5 | | | 1 | | 8 | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | 3 |
| | | | | | | | | | |
| 6 | | | | | | | | | |
| | | | | | | | 4 | | |
| 2 | | 7 | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

ගින්න
ජේසුස් වහන්සේ
පාහින
මිත්‍රයෙක්
දෙවියන් වහන්සේ
පිරිසිදුය
ප්‍රේම
ඒකාබද්ධ,

**පහළට**

1. උද්‍යාන පාලකයාණෝ වන්නේ
2. ඵල දරන සියලු අතු වඩා ඵල දරන පිණිස..... සේක.
3. අප ඵල දැරීම පිණිස ජේසුස් වහන්සේ හා ...... විය යුතුය.
4. මා පියාණන් වහන්සේගෙන් ඇසූ සියල්ල ඔබට දන්වා වදාළ බැවින් මම ඔබට ..... යයි කීවෙමි.

**හරහට**

5. මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට.......කරන්න
6. සැබෑ මිදි වැල කවරෙක් ද?
7. වියළි අතු එක් රැස් කොට ........ දමයි.
8. ඔබට ජේසුස් වහන්සේ වදාළ දහම කරණ කොටගෙන ඔබ දැනටම ..........ය.

- ජේසුස් වහන්සේ සහ ඒකාබද්ධ වීමට ඔබ කරන්නේ කුමක්ද?
- ජේසුස් වහන්සේ සමඟ ඇති මිත්‍රත්වය රැක ගැනීමට ඔබ කරන්නේ කුමක් ද?
- මෙම බයිබල් කොටසට අනුව ජේසුස් වහන්සේ අපගෙන් ඉල්ලන එකම ඉල්ලීම කුමක්ද? එම ඉල්ලීම ඉටු කිරීමට ඔබට කළ හැකි දේවල් 03 ක් ලියන්න.

**ජේසුස් වහන්සේ ප්‍රේම කළාක් මෙන් අන් අයට ප්‍රේම කරන්නටත්, උන් වහන්සේගේ ඉගැන්වීම් අනුව ක්‍රියා කිරීමටත් හැකියාව ලබා දෙන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.**

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය



8 වන ශ්‍රේණිය - 18 වෙනි පාඩම


# යහපත් බැටළු එඬේරාණෝ

**බයිබල් කොටස :- ශු. ජොහාන් 10: 1-16**

කටපාඩම් පදය: **"යහපත් එඬේරා මම වෙමි. යහපත් එඬේරා, තම ජීවිතය බැටළුවන් උදෙසා පූජා කරන්නේය."**

(ශු. ජොහාන් 10: 11)

- යහපත් බැටළු එඬේරා පිළිබඳව ඔබ දන්නා දේ පහත වෘත්තයන් තුළ ලියන්න.



- ජේසුස් වහන්සේ අපව බැටළුවන්ට සමාන කරන ලද්දේ ඇයි?

.....................................................................................................................................................

- බැටළුවන් යහපත් එඬේරාව විශ්වාස කරන ලද්දේ ඇයි?

.....................................................................................................................................................

- **"ජේසුස් වහන්සේ මාගේ යහපත් එඬේරාය"** යන මාතෘකාව යටතේ කෙටි රචනයක් ලියන්න.

❖ **ජේසුස් වහන්සේ ඔබට ලබා දුන් ආරක්ෂාව සහ මඟ පෙන්වීම උදෙසා ස්තූති කරන්න.**

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය

## 8 වන ශ්‍රේණිය - 19 වෙනි පාඩම



# ගෙත්සෙමනේ යාච්ඤාව

**බයිබල් කොටස :- ශු. මාර්ක් 14: 32 - 42**

**කටපාඩම් පදය :** " පරීක්ෂාවට නොවැටෙන පිණිස අවදිව හිඳ යාච්ඤා කරන්න; හිත නම් කැමතිය, එහෙත් ගත නම් දුබලය"

(ශු. මාර්ක් 14: 38)



- ගෙත්සෙමනේ උයනට ගොස් යාච්ඤා කිරීමට ජේසු තුමාට උවමනා වූයේ ඇයි ?

  ..........................................................................................................................

- ජේසු තුමන් සමඟ එම උයනට යාච්ඤා කිරීමට ගියේ කව්ද?

  ..........................................................................................................................

- ජේසු තුමා කරුසියට නොගොස් එයින් මිදී පලා යාමට තිබිණි. නමුත් එතුමා "අබ්බා පියාණෙනි, ...... මාගේ කැමැත්ත නොව, ඔබගේ කැමැත්ත වේවා " යනුවෙන් පවසා දෙවියන් වහන්සේගේ අණට කීකරු වූයේ මක්නිසා ද?

  ..........................................................................................................................

- ජේසුස් වහන්සේ ඔබගෙන් ඇසුවොත් " තවමත් නිදිද?, තවමත් විවේකයෙන් ද?" ඔබට දීමට ඇති පිළිතුර කුමක්ද? ඔබ අවදිව ඔබගේ අලසකම නැති කර ගැනීමට කළ යුත්තේ කුමක් ද? පැහැදිලි කරන්න..........................................................................................................................

  ..........................................................................................................................

ඔබ ඔබගෙන්ම ප්‍රශ්න කර බලන්න ඔබගේ දෙමව්පියන් දුෂ්කර දෙයක් කරන්නයැයි පැවසුවොත් ඔබ එයට කීකරු වෙනවා ද? අන් අය උදෙසා ඔබට ඔබගේ දිවි කැප කළ හැකි ද?

- ඔබ යාච්ඤා කරනවාද? ඔබට එයට නිශ්චිත දිනයක් හෝ වේලාවක් තිබෙනවා ද? නැත්නම්, යාච්ඤාව සඳහා කාලසටහනක් සාදාගෙන ඔබගේ බිත්තියේ අලවාගන්න.

- ජේසුස් වහන්සේ අප වෙනුවෙන් දුෂ්කර තේරීමක් කළේය. ඒ වෙනුවෙන් ඔබට කළ හැකි දේ කරන්න.
- ජේසුස් වහන්සේට ප්‍රශංසා කරන්න. උන් වහන්සේ උදෙසා ජීවත් වන්න. උන් වහන්සේ කෙතරම් අපූරුදැයි අන් අයට කියන්න.
- ඔබ උන් වහන්සේට ප්‍රේම කරන බව චිත්‍රයකින් , කවියකින් හෝ ගීතයකින් පෙන්වන්න.

- ජේසුස් වහන්සේ අප වෙනුවෙන් කුරුසිට කැපවී අපව ගළවා ගත් නිසාත් දැන් අප සමඟ සදහටම ජීවමානව වැඩ සිටින බැවිනුත් උන් වහන්සේට ස්තුති කරන්න.



8 වන ශ්‍රේණිය - 20 වෙනි පාඩම

## අරමුණු ප්‍රවර්ධන පාඩම

# සභාවේ අනාගතය උදේසා දේශකයන් බිහිකරමු

**කටපාඩම් පදය :** " ඔබත් සත්‍ය ධර්මය නියම ලෙස ප්‍රකාශ කරන්න, ලජ්ජා වීමට හේතුවක් නැති සේවකයෙකු ලෙස දෙවියන් වහන්සේට ප්‍රිය තැනැත්තෙකු මෙන් පෙනී සිටිමට උත්සහ කරන්න. " (2 තිමෝති 2 : 15)

**හැඳින්වීම**

1. "අද දින මා ඔබට දෙන මෙම අණපනත් සිතේ ධාරණය කරගත යුතුය." (ද්විතීය නීති සංග්‍රහය 6:6)
2. උන් වහන්සේ ඔවුන් අමතා, "ලොව පුරා ගොස් සකල සත්ත්වයා හට සුබ අස්න දේශනා කරන්න යැයි පැවසු සේක.(මාක් 16:15)"
3. " ලෝකයා අගය කොට සලකන දේ නැති කරනු පිණිස. දෙවියන් වහන්සේ ලෝකයා පහත් කොට සලකන දේ, තෝරාගත් සේක." (1 කොරින්ති 1: 28)

- දෙවියන් වහන්සේ අපෙන් ඉල්ලා සිටින්නේ උන් වහන්සේගේ වචනය අපගේ හදවත් තුළ තබාගෙන අන් අය සමඟ බෙදාගන්නා ලෙසයි. දෙවියන් වහන්සේ විසින් තම මෙහෙවර සඳහා අභිෂේක කරන මිනිසුන්ගෙන් ඔබ එක් අයෙකි. එම නිසා උන් වහන්සේගේ දේව සේවයට පිටත් වීමට සූදානම්ව සිටින්න.
- ඉරිදා පාසලේ සිටින ඔබගේ මිතුරු මිතුරියන් සමඟ බෙදා ගැනීම සඳහා කුඩා දේශනයක් සූදානම් කරගන්න.
- දේශනය සඳහා පියවර පහත දැක්වේ.

- එක් බයිබල් ඡේදයක්, කතාවක්, උපමාවක් හෝ සිද්ධියක් තෝරාගන්න. (කෙටි දෙයක් විය යුතුය)
- යාච්ඤා කර ඡේදය කිහිප වතාවක් කියවන්න.
- එය ඔබේ වචනයෙන් ලියන්න.
- ඔබේ දෑස් වසාගෙන දෙවියන් වහන්සේගේ පණිවිඩය ඔබට හෙළි කර දෙන මෙන් ඉල්ලා සිටින්න.
- යෙදුම සොයා ගැනීමට උත්සහ කරන්න.
- එය වෙනම කඩදාසියක ලියන්න.
    - හැඳින්වීම/ පිළිගැන්වීම
    - නිදර්ශනය (උදාහරණ)
    - පණිවිඩයේ අන්තර්ගතය
    - යෙදුම
    - යාච්ඤාව




ආදරණීය දෙවියනි ඔබේ සත්‍ය හෙළි කර ඔබේ මාර්ගය මට පෙන්වන්න



**8 වෙනි ශ්‍රේණිය - 21 වෙනි පාඩම**

# සැමට සුබ අස්න

**බයිබල් කොටස : ක්‍රියා 8: 4 -25**

**කටපාඩම් පදය: "දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්, ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කෙළේ, උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය. "(ශු. ජොහාන් 3: 16)**

- පිලිප් සමාරියේ දි ජේසුස් වහන්සේගේ නාමයෙන් කළ අරුම පුදුම ක්‍රියා ලියන්න.

……………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………

- සමාරියේ ජනතාව පිලිප් විශ්වාස කිරීමට මුලික වූයේ ඔහු කුමක් දේශනා කළ නිසාද?

……………………………………………………………………………………………………………………

- පේදුරු සහ ජොහාන් සමාරියට පැමිණ එහි සිටි ජේසුස් වහන්සේ අදහාගත්තවුන්ට ශුද්ධාත්මයාණන් ලැබෙන ලෙස යාච්ඤා කිරීමට හේතුවූයේ කුමක් ද?

……………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………

- දේව දීමනා ලබා ගැනීමට අප කුමක් කළ යුතුද?

……………………………………………………………………………………………………………………

- දෙවියන් වහන්සේගේ දරුවෙකු ලෙස දේව භක්තික ජීවිතයක් ගත කිරීමට ඔබ උත්සහ කරන්නේ කෙසේද?

……………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………

- ශුද්ධාත්මයාණන්ගේ බලය ඔබ තුළ ක්‍රියාත්මක වන බව ඔබට දැනී තිබෙනවා ද?
- අසත්‍ය සහ බොරු ප්‍රාතිහාර්යන් ඔබ මුලා කිරීමට උත්සහා දරා තිබේද?
- සුබ අස්න එය නොදන්නා අයට කියා දීමට ඔබ උත්සහා දරා තිබේ ද?

- **අභියෝග හමුවේ නොසැලි සිටීමටත් ශුද්ධාත්මයාණන්ගේ බලය ඔබ තුළ ක්‍රියාත්මක කරන ලෙසත් ඉල්ලා දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න.**

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**





**8 වෙනි ශ්‍රේණිය - 22 වෙනි පාඩම**

# පේදුරු හා කෝර්නේලියස්

**බයිබල් කොටසඃ ක්‍රියා 10ඃ 1-48**

කටපාඩම් පදය : **"එවිට පේදුරු මෙසේ කීය, දෙවියන් වහන්සේ මිනිසුන්ගේ තරාතිරම් නොබලන බව දැන් මට සැබැවින්ම පැහැදිලිය." (ක්‍රියා 10:34)**

- පේදුරු තුමා දුටු දර්ශනය කුමක්ද? එය පැහැදිලි කරන්න (ඔබට චිත්‍රයක් වුව ද ඇඳිය හැකිය)

.............................................................................................................................................

- පේදුරු තුමා තමන් දුටු දර්ශනය අන් අයට පැහදිලි කර දුන්නේ කෙසේ ද? ඔබගේ වචනයෙන් ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

- එම දර්ශනය මගින් පේදුරු තුමා වෙනස් කරගත් ඔහුගේ ආකල්පය කුමක් ද?

.............................................................................................................................................

- කෝර්නේලියස් කවරාකාරයේ පුද්ගලයෙක් ද?

.............................................................................................................................................

- ඔබට වැටහුනු පරිදි පේදුරු සහ කෝර්නේලියස් මුණ ගැස්වීමේ දෙවියන් වහන්සේගේ අභිප්‍රාය කුමක් ද?

.............................................................................................................................................

- මෙම බයිබල් කොටසෙන් ඔබ ඉගෙන ගත් පාඩම කුමක් ද?

.............................................................................................................................................

- **"දෙවියන් වහන්සේ පවිත්‍ර කළ දේ අපවිත්‍රයි නොකියන්න"**
  - සිතා බලන්න මෙම වසංගත කාලයේ රෝග වලට බියේ ඔබ හෝ ඔබගේ පවුලේ අය ශුද්ධ වු සහභාගිකම ප්‍රතික්ෂේප කරනවා ද?
  - විවිධ හේතූන් මත දෙවියන් වහන්සේ විසින් මවන ලද මිනිසුන් වෙනස් කොට සලකනවා ද?
- දෙවියන් වහන්සේ අපට යමක් කිරීමට අණ කළ විට එය කුමක් වුව ද එය කිරීමට අප සුදානම් විය යුතුය.

❖ **ජේසුස් වහන්සේ මෙන් පුද්ගලයන්ට සමානව සැලකීමටත් ශුද්ධාත්මයාණන්ගේ නිවැරදි මග පෙන්වීමත් ඉල්ලා යාච්ඤා කරන්න.**

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය





## 8 වෙනි ශ්‍රේණිය - 23 වෙනි පාඩම

# බයිබල් පරිවර්තනය

**කටපාඩම් පදය:** "එහෙත්, තමන් ම රවටා නොගෙන දහම් පණිවුඩය අසන්නන් පමණක් නොවී, එය පිළිපදින්නෝ වන්න." **(ජාකොබ් 1:22)**

## බයිබලය හැඳින්වීම


දේවානුභාවයෙන් රචිත ශුද්ධ වු බයිබලය ලෝකයේ සියලුම දේශයන් හි ජීවත් වන ක්‍රිස්තු භක්තිකයන්ගේ ඇදහිල්ලට පදනම් වන අති පූජනීය ග්‍රන්ථයයි. පොත් මාලාවක එකතුවක් වන ශුද්ධ බයිබලය එකම ග්‍රන්ථයක් ලෙස සැලකෙන්නේ එහි පොදු තේමා කිහිපයක් දක්නට ලැබෙන බැවිනි. දෙවියන් වහන්සේ සහ මිනිසා අතර සම්බන්ධතාවය, ජේසුස් වහන්සේ තුළ **"ගැළවීම"** , මිනිස් සංහතියට දෙවියන්වහන්සේගේ එළිදරව්වීම හා දෙවියන් වහන්සේට ලැබෙන මිනිස් ප්‍රතිචාරය උදාහරණ ලෙස දැක්විය හැකිය.

### ශුද්ධ වු බයිබලය විකාශය වු ආකාරය

- මුල් යුගයේ දේව වචනය ලේඛනගත වීමට පෙර කටින් කට පරම්පරාවෙන් පරම්පරාවට ප්‍රචාරය වෙමින් පැවතී ඒවා විය. එයට, "මුඛ පරම්පරාගත සම්ප්‍රදය" යයි කියනු ලැබේ.
- පසුකාලීනව ගල් පුවරු, පදම් කළ සත්ව හම්, පැපිරස් නම් වු ශාඛ පත්‍ර ආදිය භාවිතා කරමින් ඒවා මත සටහන් තබන්නට හුරුවිය.
- සකස් කරගත් හැකුළුම්පත්වල ශුද්ධ ලියවිල්ල ලියා දේව මාලිගාවේ ද, සිනගෝගවල පමණක් සියලු දෙනාගේ භාවිතය සඳහා තබා තිබුණි.

### ශුද්ධ වු බයිබලය කාණ්ඩ දෙකකින් යුක්ත වේ.

- **පැරණි ගිවිසුම** සහ **අලුත් ගිවිසුම** යනුවෙන් බයිබලය කොටස් දෙකකින් සමන්විත වේ.
- පැරණි ගිවිසුමේ පොත් 39 කි. එය ජේසුස්වහන්සේට පෙර වන අතර, ජේසුස්වහන්සේ සහ අපෝස්තුළුවරුන්ට ශුද්ධ ලියවිල්ල (බයිබලය ) වූයේ පැරණි ගිවිසුමයි.
- අලුත් ගිවිසුම ජේසුස් වහන්සේට පසුවය. සමදර්ශක ශුභාරංචි හා, ක්‍රියා හා යැවුම් පත්‍ර (හසුන්)සමග එහි පොත් 27 කි.
- රෝමානු කතෝලික හා ඕතොඩොක්ස් සභා භාවිතා කරන බයිබලයේ පොත් 72ක් අඩංගු වේ. එයට හේතුව වන්නේ එහි ද්විතීය සම්මත ග්‍රන්ථ ලෙස හඳුන්වන පොත් 06ක් ඇතුලත් වී තිබීමයි.




### බයිබලය විවිධ භාෂාවන්ට පරිවර්ථනය විය.

ජේසුස් වහන්සේගේ මරණින් පසු උත්ථානයෙන් අන්‍යජ ජාතීන්ට ශුභාරංචි පණිවිඩය පැතිර යාමත් සමග බයිබලය විවිධ භාෂාවන්ට පරිවර්ථනය වීම ඇරඹිණි. සෑම කිතුනුවෙකුටම ස්වදේශීය භාෂාවෙන් බයිබලය හැදෑරීමට ලැබීම වැදගත් විය. මේ වන විට සම්පූර්ණ බයිබලය භාෂා 264 කට පරිවර්තනය වී ඇත. එසේ වුවත් පරිවර්තනයන්හි දි එහි මුල් පිටපත් වල නිරවද්‍යතාවය සුරැකීමට උත්සහ කර ඇති බව දක්නට ඇත.

- යුදෙව්වන්ගේ භාෂාව වූ **හෙබ්‍රෙව් භාෂාවෙන්** පරණ ගිවිසුම ලියා ඇත.

- පොත යන අරුත ඇති **"බිබ්ලියා"** නම් ග්‍රීක වචනයෙන් **බයිබලය** යන වචනය සෑදේ.
- එකල භාවිතා කළ ලෝක භාෂාව වූ **ග්‍රීක භාෂාවෙන්** අලුත් ගිවිසුම ලියා ඇත. (මෙම භාෂාවන් මධ්‍යධරණී ලෝකය තුළ බහුලව භාවිතා කර ඇත)
- **බයිබල (BIble)** යන ඉංග්‍රිසි වචනය **බයිබලය** යනුවෙන් සිංහල භාෂාවට පරිවර්තනය වී ඇත.

### ග්‍රීක භාෂාවට පරිවර්තනය

- **සෙප්තුවාජින්තය** - ඇලෙක්සැන්ඩ්‍රියාවේ ටොලමි විසින් ජෙරුසලමෙන් ලේඛකයින් 70 දෙනෙකු ගෙන්වා ගෙන හෙබ්‍රෙව් භාෂාවෙන් ලියන ලද පැරණි ගිවිසුම ග්‍රීක භාෂාවට පරිවර්තනය කිරීම මෙසේ හැඳින්වේ. සෙප්තුවා යන්නෙහි අර්ථය හැත්තෑව යන්නයි.

### ලතින් භාෂාවට පරිවර්තනය


- **වල්ගේට්** - ශාන්ත ජෙරොම් තුමා විසින් ලතින් භාෂාවට කරන ලද පරිවර්තනය මෙසේ හැඳින්වේ. ක්‍රි.ව 450 දි එය භාවිතයට ගැණිනි.

### ඉංග්‍රිසි භාෂාවට පරිවර්තනය

- ජෝන් වයික්ලිෆ් පූජක තුමා විසින් ලතින් පිටපත ඉංග්‍රිසි භාෂාවට පරිවර්තනය කිරීම සභා නායකයින්ගේ විරෝධය නිසා ඔක්ස්ෆර්ඩ් මන්ත්‍රණ සභාව එය තහනම් කරන ලදි.
- විලියම් ටින්ඩෙල් පූජකතුමා විසින් ශුද්ධ බයිබලය නැවත ඉංග්‍රිසි භාෂාවට පරිවර්තනය කර 1526 දි අලුත් ගිවිසුම මුද්‍රණය කළේය.

### ජර්මන් භාෂාවට පරිවර්තනය

- මාටින් ලූතර් විසින් ශුද්ධ බයිබලය ජර්මන් භාෂාවට පරිවර්තනය කළේය.



- ❑ **ඔබගේ මව් භාෂාවෙන් බයිබලය කියවීමට ලැබීම ඔබට දැනෙන්නේ කෙසේ ද?**
- ❑ **බයිබලය විකාශනය වීම ගැන තව තොරතුරු රැස් කරමින් පොත් පිංචක් සකස් කරන්න.**
- ❑ **ශු. බයිබලය කියවීමෙන් ඔබගේ ජීවිතයට උගත් පාඩම් මොනවා ද?**

ඉහත සඳහන් බයිබලය පිළිබඳ තොරතුරු ඔබගේ මතක පොතට එකතු කරගන්න. ඔබ ඉගෙන ගත් දේ අන් අය හා බෙදා ගන්න.

- ඔබ සන්තකව බයිබලයක් තබා ගන්න. ඔබට බයිබලයක් නොමැති නම් එය මිලදී ගැනීමට උත්සහ කරන්න.
- දිනපතා බයිබලය කියවන්න.
- ඔබ ඉගෙන ගත් බයිබල් කතන්දර පවුලේ අය හා මිතුරු මිතුරියන් සමඟ බෙදා ගන්න.

අපගේ භාෂාවෙන්ම බයිබලය කියවීමට හැකියාව ලබා දීම ගැන ස්තුති කරමින් උන් වහන්සේගේ දේව වචනය තේරුම් ගැනීමට උපකාරය ඉල්ලා යාච්ඤා කරන්න






## 8 වෙනි ශ්‍රේණිය - 24 වෙනි පාඩම

# ශ්‍රී ලංකාව තුළ බයිබලයේ විවිධ අනුවාද

කටපාඩම් පදය: **ලෝකයේ විවිධ භාෂා ඇතත්, ඉන් එකක් වත් අර්ථ විරහිත නොවේ.** (1 කොරින්ති 14: 10)




## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ විවිධ අනුවාදයන් ඇති බයිබල් කිහිපයක් භාවිත වේ. ඉංග්‍රිසි බයිබලයේ අනුවාද 100 කට වඩා වැඩි සංඛ්‍යාවක් ඇත. ඒවායෙන් ග්‍රීක, ඇරමික්, වැනි භාෂාවන් වලින් ලියා ඇති බයිබල් වල අර්ථ ප්‍රකාශ කිරීමට පරිශ්‍රමයක් දරා ඇත. ඇතැම් අනුවාද කියවන්නාට පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයෙන් සරල ලෙස පරිවර්තනය කර ඇත. කෙතරම් නිකායන් පල්ලි සංස්කෘත හා සංවිධාන ලොව පුරා පැතිර ඇතත් සියලු ක්‍රිස්තු භක්තිකයන් පොදුවේ පිළිගන්නා එක් බයිබලයක් ඇත.

### ශ්‍රී ලංකාව තුළ බයිබලීය අනුවාදයන්

ලංකාවට කිතු දහම හඳුන්වා දෙනු ලැබුවේ පෘතුග්‍රීසින්ය. ලන්දේසින් සහ ඉංග්‍රිසින් විසින් කිතු දහම ව්‍යාප්තියට මහත් බලපෑමක් කරන ලදි.





- ඉංග්‍රිසි ලන්දේසි පෘතුග්‍රීසි භාෂාවලින් යුත් බයිබල් ලන්ඩනයෙන් ආනායනය කරන ලදි.
- බ්‍රිතාන්‍ය ජාතික විලියම් ටොල්ෆ්‍රේ (William Tolfrey) ඉංග්‍රිසි බයිබලය සිංහලට පරිවර්තනය කරන ලදි.
- දමිළ භාෂාවෙන් ශුද්ධ ලියවිලි ලබාගෙන ඇත්තේ කල්කටා සභාවෙන්ය.
- බැප්ටිස්ට් සහ මෙතොදිස්ත මිෂනාරි වරු ලංකාවට පැමිණෙනතුරු සිංහල භාෂාවෙන් ශුද්ධ ලියවිල්ලක් තිබුණේ නැත. ඔවුන් තම දේශන සහ ආගමික සාහිත්‍යම ලිපි සඳහා සිංහල භාෂාව භාවිත කරන ලදි.
- කතෝලික රදගුරු මණ්ඩලයේ අනුමැතිය ඇතිව 1982 වසරේදී සිංහල බයිබලය ප්‍රකාශයට පත් කෙරිණි. නව සංශෝධිත සිංහල බයිබලයෙහි තුන්වන සංස්කරණය 2006 දී ප්‍රකාශයට පත් කළේය
- ශ්‍රී ලංකාව තුළ දැනට සිංහල, දමිළ, සහ ඉංග්‍රිසි භාෂා ත්‍රිත්වයෙන් බයිබල් අනුවාද භාවිතා කරනු ලැබේ.

- ඔබ ඔබගේ පවුලේ අය සමඟ බයිබලය කියවා පවුලේ යාච්ඤා කාලයක් ගතකරනවා ද? එසේ නොමැතිනම් අදම එය ආරම්භ කරන්න.
- බයිබලය පිළිබඳව ඔබගේ මිතුරුමිතුරියන්ට ඔබ කියා දෙන්නේ කෙසේ ද?
- බයිබලය පිළිබඳව ලියා ඇති ලිපි සොයා එකතු කරන්න.

- දිනපතා බයිබලය කියවන්න. ඔබගේ සිතට දැනෙන බයිබල් පදය මෙනෙහි කරන්න. එය පොතක් ගෙන සටහන් කරන්න.
- දෙවියන් වහන්සේගේ දේව වචනය සඳහන් බයිබලය කියවා එය මෙනෙහි කරමින් යාච්ඤා කිරීමට භාවනාත්මක කාලයක් යොදවා ගන්න.



ස්වභාෂාවන්ට බයිබලය හැදෑරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දී ලෝ වැසි කිතුනු ජනතාව තුළ ඒකත්වයක් වර්ධනය කිරීම ගැන දෙවියන් වහන්සේට ස්තුති කරමින් යාච්ඤා කරන්න.



**8 වන ශ්‍රේණිය - 25 වෙනි පාඩම**

# හෙසකියා රජ

**බයිබල් කොටස : 2 වංශාවලිය 29: 1-19**

**කටපාඩම් පදය : " අල්ප දේ ගැන විශ්වාස තැනැත්තේ මහත් දේ ගැනත් විශ්වාසී වෙයි. අල්ප දේ ගැන වංචනික තැනැත්තේ මහත් දේ ගැනත් වංචනික වෙයි."**
**(ශු. ලූක් 16: 10)**

**නිවැරදි පිළිතුර තෝරන්න**

1. හෙසකියා රජ වන විට ඔහුගේ වයස අවුරුදු ?
   I. වයස අවුරුදු 20
   II. වයස අවුරුදු 29
   III. වයස අවුරුදු 25
   IV. වයස අවුරුදු 22

2. හෙසකියාගේ ධර්මිෂ්ඨකමට සමාන වූ රජෙකි
   I. සාවුල්   II. දාවිත්   III. සලමොන්   IV. ජෙරොබෝවම්

3. හෙසකියා දේව මාළිගාවේ දොරටු විවෘත කර ඒවා අලුත් වැඩියා කිරීම ඇරඹුවේ
   I. ඔහු රජ වූ පළමු දින
   II. ඔහුගේ මරණයට පෙර මාසයේ
   III. ඔහුගේ පාලන සමයේ පළමු වසරේ පළමු මාසයේ
   IV. ඔහු රජ වීමට පෙර වසරේ




4. දේව මාළිගාව පවිත්‍ර කිරීම සඳහා හෙසකියා රජු විසින් මොවුන් රැස් කරන ලදි
   I. හමුදා සෙබළුන් සහ රාජකීය කුමාරයන්
   II. පූජකයන් සහ ලෙවීවරුන්
   III. පූජකයන් සහ හමුදා සෙබළුන්
   IV. ලෙවීවරුන් සහ රාජකීය කුමාරයන්

- හෙසකියා රජෙකු ලෙස දෙවියන් වහන්සේ උදෙසා කළ පළමු කාර්ය කුමක් ද?
  ..............................................................................................................................
- හෙසකියා රජු පැවසූ ආකාරයට ශුද්ධස්ථානයෙන් අපවිත්‍රකම පහකිරීමට පෙර කළ යුත්තේ කුමක් ද? ..............................................................................................................................
- හෙසකියා රජුගෙන් ඔබට ඉගෙන ගැනීමට ඇති නායකත්වයේ ගුණාංග මොනවාද??
  ..............................................................................................................................
- කණ්ඩායමක වගකීම ගැනීමේ දී සහ අන් අයට වගකීම් පැවරීමේ දී ඔබ ක්‍රියා කරන්නේ කෙසේ ද?..............................................................................................................................

❖ ඔබගේ ජීවිතයට දෙවියන් වහන්සේ දී ඇති සියලු ශක්තීන් පිළිබඳ ස්තුති කරමින්, දේව දරුවකු ලෙස අවශ්‍ය අවස්ථාවලදී නායකත්වයේ ගුණාංග විදහාපාන්නට හැකියාව ඉල්ලා යාච්ඤා කරන්න.

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය

**8 වෙනි ශ්‍රේණිය - 26 වෙනි පාඩම**



# නෙහෙමියා

**බයිබල් කොටස : නෙහෙමියා 1: 1-11, 5: 11-19**

**කටපාඩම් පදය : "කුමක් හෙයින් ද මනුෂ්‍ය පුත්‍රයාණන් වුව ද වැඩියේ සේවය ලැබීමට නොව, සේවය කිරීමටය. බොහෝ දෙනා උදෙසා මිදීමේ මිලයක් වී සියදිවි පිදීමටය."**

**(ශු. මාක් 10: 45)**

- නෙහෙමියා දෙවියන් වහන්සේට කළ යාච්ඤාවේ වැදගත් ලක්ෂණ පිළිවෙලින් ලියන්න. ( නෙහෙමියා 1: 5-11)
  උදාහරණ - දෙවියන් වහන්සේ වර්ණනා කිරීම
  ..........................................................................................................................................
  ..........................................................................................................................................
  ..........................................................................................................................................
  ..........................................................................................................................................
- නෙහෙමියාගේ ජීවිතයේ දක්නට ඇති නායකත්වයේ ලක්ෂණ මොනවාද?
  ..........................................................................................................................................
  ..........................................................................................................................................
- නෙහෙමියා දෙවිදුන් වෙනුවෙන් තම ජීවිතය යෙදවුයේ කෙසේ ද?
  ..........................................................................................................................................
  ..........................................................................................................................................
- ඔහු තම බලතල අයුතු ලෙස භාවිත නොකළ බවට ඇති උදාහරණය ලියන්න.
  ..........................................................................................................................................
  ..........................................................................................................................................
- ඔබට නෙහෙමියාගෙන් ඉගෙන ගැනීමට ඇති පාඩම කුමක් ද?
  ..........................................................................................................................................
  ..........................................................................................................................................

- ඔබ නායකයෙකු වුවහොත් සේවය කිරීමට වරප්‍රසාද බලාපොරොත්තු වෙනවා ද?
- නෙහෙමියා තම ඇදහිල්ල මත සියලු බාධක මැඩලු ආකාරය ඔහුගේ කතාව කියවීමෙන් ඔබට ඉගෙන ගත හැකිය. ඔබට හැකිනම් ඔහුගේ මුළු කතාව කියවීමට වෙලාව වෙන් කරගන්න. ඔහු දෙවියන් වහන්සේ මත පිහිටා ශක්තිමත්ව නිර්භයව අභියෝග ජයගත් ආකාරයත් ඔහුගේ යටහත් පහත් භාවයත් ඔබට ඉගෙන ගැනීමට හැකිවේ.

**වරප්‍රසාද උදෙසා නොව තම සේවය යුතුකමක් සහ වගකීමක් ලෙස ඉටුකිරීමට හැකියාව ලබා දෙන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න**



**8 වන ශ්‍රේණිය - 27 වන පාඩම**

# සාවුල් නම් වූ පාවුල්


**බයිබල් කොටසඃ ක්‍රියා 8:1-3, 9ඃ 1-25, 13:9, 26ඃ 4-16, පිලිප්පි 3ඃ 4-7,**

**කටපාඩම් පදයඃ "ඔබ මා තෝරා ගත්තේ නැත.ඉමම ඔබ තෝරාගෙන පත් කළෙමි. එසේ කළේ, ඔබ ගොස් බොහෝ පල දරන පිණිසත්, ඔබේ පල පවතින පිණිසත්, මාගේ නාමයෙන් ඔබ පියාණන් වහන්සේගෙන් ඉල්ලන කවර දෙයක් වුව ද උන් වහන්සේ ඔබට දෙන පිණිසත් " (ශු. ජොහාන් 15ඃ 16)**

**වරහන් තුළින් පිළිතුරු තෝරා හිස්තැන් පුරවන්න.**

( ආලෝකයක්, නුවරට, උත්තම පූජකයා, සාවුල්, භ්‍රාන්ත, අනනීයස්, ශ්‍රාවකයන්, තුන් දවසක්, පීඩා, බැබළිණි, ජෙරුසලමට, පෙනීම, ජේසුස්ය, දමස්කයේ, තාර්සස්, ස්වාමිනී, බලපත්‍ර, නොකානොබී )

- සාවුල් ............................ වෙත ගොස් සමිදාණන් වහන්සේගේ ................ අල්ලාගෙන ................ ගෙන එන පිණිස ................... ධර්මශාලාවට ඉදිරිපත් කරනු පිණිස .....................ඉල්ලා ගත්තේය.
- ඔහු දමස්කයට ළං වූ කල හදිසියෙන් අහසින් ................. ඔහු අවට ................... ඔහු ............. වී බිම වැටුණේය. එවිට ............. සාවුල් ඔබ මට ............ කරන්නේ මන්දැයි කියන හඬක් ඔහුට ඇසිණි.
- ................ ඔබ කවරෙක් ද? යනුවෙන් ඔහු ඇසීය. මම ඔබ විසින් පීඩා කරනු ලබන ................ නැගිට ............. ඇතුළු වන්න, ඔබ කළ යුතු දේ ඔබට කියනු ලැබේ යැයි එම හඬ පැවසීය.
- සාවුල් ......................... ඇස් නොපෙනී ...................... සිටියේ ය.
- සමිදාණන් වහන්සේ ................... ට කතා කර ................ හි වැසියෙකු වන සාවුල් වෙත ගොස් ඔහුට...................... ලැබීම පිණිස අත තබන්නැයි පැවසීය.



- **පාවුල්ගේ ජීවිතයේ ජේසුස් වහන්සේ මුණගැසීමට පෙර සහ පසු චරිත ගුණාංග සඳහන් කරමින් පහත වගුව පුරවන්න.**

| පාවුල් ජේසුස් වහන්සේ මුණ ගැසීමට පෙර | පාවුල් ජේසුස් වහන්සේ මුණ ගැසීමෙන් පසු |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

❖ ජේසුස් වහන්සේව වඩා හොඳින් දැන ගැනීමටත්, අන් අයට උන් වහන්සේ ගැන හොඳින් කියා දීමටත් හැකියාව ලබා දෙන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය



8 වන ශ්‍රේණිය - 28 වෙනි පාඩම

# මාටින් ලූතර්



**කටපාඩම් පදය: '' සමිඳුනි ඔබේ තිර පෙම ගැන මම සදහටම ගයන්නෙමි. ඔබේ විශ්වාසවන්තකම පරපුරෙන් පරපුරට පවසන්නෙමි.''**

**(ගීතාවලිය 89 :1)**

## හැඳින්වීම

සැක්සනි ප්‍රදේශයේදි 1483 වර්ශයේ උපත ලද මාර්ටින් ලූතර් පතල් කම්කරුවෙකුගේ පුතෙකි. බොහෝ දුක් කම්කටළු මධ්‍යයේ වුව ද ඔහු හොඳින් අධ්‍යාපනය ලැබීය.එර්ෆන්ට් විශ්වවිද්‍යාලයට පිවිස 1505 දී පශ්චාත් උපාධිය ලබා ගැනීම. එහිදී දර්ශන විද්‍යාව හැදෑරීය. නීතිය හැදෑරීමට අවස්ථාව තිබියදී එර්ෆන්ට් තාපසාරාමයේ කෙටි කාලයක් ගත කිරීමෙන් පසු අගෝස්තියානු නිකායට අයත් පූජකයෙකු වශයෙන් හදිසියේම පැවිදි විය. විටෙන්බර්ග්හී 1507 වර්ශයේ ධර්මදේශනා ආරම්භ කළේය. 1512 දේවධර්මය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ගත් මෙතුමා විටෙන්බර්ග් විශ්වවිද්‍යාලයේ මහාචාර්යය ධුරයට පත් විණි. 1515 දී අගොස්තියානු තාපසාරාම 11 ක ප්‍රධානියා වශයෙන් ඒවාහි පරිපාලන කටයුතු ද ඔහුට බාරවිය.

රෝම සභාව විසින් වන්දි මුදලක් ගෙවීමෙන් පව්වලින් නිදහස් විය හැකි අවස්ථාවක් ධනවතුන්ට ලබා දෙමින් පාප්තුමාගේ අත්සනින් යුතුව 'අදණ්ඩනාවසර' නැමැති ලියවිල්ලක් ඉදිරිපත් කළේය. මාර්ටින් ලූතර් එයට විරුද්ධව තර්ක 95 ක් ඉදිරිපත් කරන ලද ලියැවිල්ලක් තම විශ්ව විද්‍යාලීය දේවස්ථානයේ දොරටුවේ සවි කළේය. කතොලික සභාව විවේචනය කිරීම නිසා බොහෝ පිරිස ඔහු වටා එක්රොක් විය. මේ අයගේ සහයෙන් ලූතර් තම ඉගැන්වීම් පිළිබඳ පොත් තුනක් නිකුත් කළේය. 1520 දී එයට ප්‍රතිචාර දැක් වු පාප් තුමා සියලු ලියකියැවිලි විනාශ කරන ලෙසත්, '' අදණ්ඩනාවසර'' වලට විරුද්ධව නගන ලද තර්ක වලින් 41 ක් ප්‍රතික්ෂේප කරන ලෙසත් නියෝග කරන ලදි. ඔහු එය සිදු නොකරන ලද නිසා සභාවෙන් ඉවත් වීමට සිදු විය. ජර්මනියේ ආගමික ප්‍රතිසංස්කරණයට මුල් වුයේ මෙතුමාය. ඔහුට අවශ්‍ය වුයේ ආගමික විප්ලවයක් නොව සභාව තුළ සංශෝධනයක් පමණි.

කිතු දහම හැදෑරීම බයිබලයේ ඉගැන්වීම මත ස්ථාපනය විය යුතු බව ඉගැන්වු ලූතර් ජර්මන් ජනතාවට බයිබලය ඔවුන්ගේ බසින් කියවීමට බයිබලයේ 1 වෙනි ජර්මන් අනුවාදය පිළියෙල කළේය. එමෙන්ම ජනව්‍යවහාරයට හුරුපුරුදු භාෂා ශෛලයෙන් ලියැවුනු ඉතා ජනප්‍රිය ගීත රැසක් ප්‍රදානය කළේය.

**ලූතර්ගේ ප්‍රධාන ඉගැන්වීම්**

- ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි දක්වන ඇදහිල්ලෙන් මිස කිතු බැතියන්ට විමුක්තියක් නොමැති බව.
- ජේසුස් වහන්සේ විසින්ම අනුමත කරනු ලැබු සක්‍රමේන්තු වශයෙන් බෞතිස්ම ස්නාපනයට හා ශුද්ධවු සහභාගිකමට පමණක් මුල් තැන දිය යුතු බව.
- කිතු සසුන සියලු ඇදහිලිවන්තයන්ගේ සහභාගිත්වයක් ලෙස පිළිගත යුතු බව.
- සියල්ලන්ටම සේවය කිරීමේ අයිතිය ආරක්ෂා කළ යුතු වුවත්, ක්‍රිස්තුස් වහන්සේ හැර, කිසිවකුට වහල් නොවිය යුතු බව.

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

- මාටින් ලූතර්ගේ ජීවිතය තුළින් ඔබට ගත හැකි ආදර්ශය කුමක් ද?

……………………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………………

- සභාවේ වර්ධනයට දායක වීමට ඔබට අවස්ථාවක් ලැබුනොත් ඔබ එය ඉටු කරන්නේ කෙසේ ද?

……………………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………………………

- සභාවේ වර්ධනය උදෙසා දායකත්වය ලබා දුන් නායකයන් පිළිබඳව කරුණු රැස් කර කුඩා පොත් පිංචක් සකස් කරන්න.

➢ අපගේ කිතුනු ඇදහිල්ල ක්‍රිස්තුස් වහන්සේ මත විශ්වාසයෙන් ගොඩනැගිය යුතුය.

➢ අපට දෙවියන් වහන්සේ දුන් දීමනා දේව ගෞරවය හා මහිමය උදෙසා පමණක් කැප කිරීමට යොමු වීම.

➢ අනාගතයේ දී බයිබලය පිළිබඳව වැඩිදුර අධ්‍යනය කර ඒ පිළිබඳව පොත් හෝ ලිපි ලිවීමට උත්සහා දරන්න

❖ **ඔබගේ හැකියාවන් තුළින් දේව රාජ්‍ය උදේසා සේවය කිරීමට ඔබව සුදුස්සෙක් කරන මෙන් ඉල්ලා යාච්ඤා කරන්න.**




## 8 වන ශ්‍රේණිය - 29 වෙනි පාඩම

# ලංකා බයිබල් සමාගම

### හැදින්වීම

බයිබලයක් සොයා ගැනීම පවා අමාරු කාලයක් තිබුණි. බයිබලයේ වටිනාකම ද කියා නිම කළ නොහැකි විය. ප්‍රථම බයිබල් සමාගමට අඩිතාලම වැටුණේ බ්‍රිතාන්‍යයේ වේල්ස් ප්‍රදේශයේ 1784 දී උපත ලද මේරි ජෝන්ස් යන අවුරුදු 9ක ගැහැණු දරුවෙක් නිසාවෙන්ය. මේරිට ඇයටම කියා බයිබලයක් හිමි කර ගැනීමට ආශාවක් ඇති විය. ඒත් බයිබලය ඉතා මිල අධික බැවින් දිළිඳු ඇයට එම කටයුත්ත වෙනුවෙන් බොහෝ වෙහෙස මහන්සි වීමට සිදුවිය. (දර එකතු කර විකිණීම, බිත්තරවිකිණීම, ගෙවල් වල වැඩ කිරීම) ඇයට මුදල් එකතු කර ගැනීමට වසර 6ක් ගත විය. මෙම ක්‍රියාව දැන ගත් තෝමස් චාල්ස් නැමැත්තා හැම කෙනෙක්ටම තමන්ගේ භාෂාවෙන් බයිබල් ලබා දීමට පියවර ගත්තේය. එහි ප්‍රතිඵලයක් ලෙස **බ්‍රිතාන්‍ය හා විදේශීය බයිබල් සමාගම** 1804දී පිහිටුවනු ලැබීය.

1812 දි එහි ශාඛාවක් ලංකාවේ ආරම්භ කළේය.1944 දී **ලංකා හා ඉන්දියානු බයිබල් සංගමය** පිහිටුවනු ලැබීය. 1965 **දී ලංකා බයිබල් සමාගම (Ceylon Bible Society)** ස්වාධින ආයතනයක් බවට පත් විය. ශ්‍රී ලංකාව තුළ බයිබල් සමාගම වැඩ කටයුතු ඇරඹී වසර 200 ක් ද ඉක්මවා ගොස් ඇත. ලංකාවේ කිතුනු ජනතාවට බයිබල් පරිවර්ථනය කර මුද්‍රණය කිරීම් කටයුතු සිදු කරන ලංකා බයිබල් සමාගම ශ්‍රී ලාංකික සංස්කෘතික හා ජන වහර යොදා ගනිමින් බයිබලයේ නව අනුවාදය 1982 දී නිකුත් කළේය. එහි ප්‍රතිසංස්කරණ පිටපත 2006 දී නිකුත් කරන ලදී. සභා භේදය හා නිකා භේදය නොමැතිව සියලු කිතුනු ප්‍රජාවන් එකතුව පොදු නව අනුවාදය නිකුත් කිරීම සභා අතර අන්‍යෝන්‍ය එකමුතුකම පිළිබිඹු කරයි.



**ලංකා බයිබල් සමාගමේ ප්‍රධාන අරමුණු :-**

- ශ්‍රී ලංකාවේ වෙසෙන සියලු ජනතාවට දේව වචනය ව්‍යප්ත කිරීම.
- ශුද්ධ ලියවිලි පරිවර්ථනය, ප්‍රකාශනය, බෙදා හැරීම.
- ශුද්ධ ලියවිල්ල ජීවිතයට අදාල කර ගැනීමට උපකාර කිරීම.

**ලංකා බයිබල් සමාගමේ ඉලක්කය :-**

සෑම කිතුනු නිවසකටම ශුද්ධ බයිබලයක්, නව ගිවිසුමක් හෝ ශුද්ධ ලියවිලි කොටසක් හෝ ලබා දීමට කටයුතු කිරීම.

- ශ්‍රී ලංකා බයිබල් සමාගමේ ඉලක්ක සැපරීම සඳහා ඔබට දායක විය හැක්කේ කෙසේද?

> - ඔබට අද ඉතා පහසු මිලට බයිබල් බයිබල් සමාගමෙන් මිලදී ගත හැකිය.
> - මේරි ජෝන්ස් වැනි බයිබලයේ අවශ්‍යතාව ඇති දරුවන්ට බයිබල් පරිත්‍යාග කිරීමට ඔබට දායක වීමට ඔබ කැමති ද?.

**ලෝ වාසී ජනතාව අතර දේව වචනය ව්‍යප්ත කිරීමට දායක වන ශ්‍රී ලංකා බයිබල් සමාගම ඇතුළු විවිධ සමාගම් වලට දුන් කරුණාව ගැන ස්තූති කර ඔවුන්ගේ අරමුණු සාර්ථක කර ගැනීමට මඟපෙන්වන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.**

ශ්‍රී ලංකා බයිබල් සමාගම,
293, ගාලු පාර, කොළඹ 03,
දුරකථන අංකය : 011265583/ 0112575180
විද්‍යුත් තැපෑල් ලිපිනය :info@ceylonbiblesociety.org





### 8 වන ශ්‍රේණිය - 30 වෙනි පාඩම
### අරමුණු ප්‍රවර්ධන පාඩම
# සමාජ සත්කාර සේවයේ අගය

**කටපාඩම් පදය:** " **සැමදෙන තමතමාගේ යහපත පමණක් නොසොයා අනුන්ගේ යහපත ගැනද සලකන්න. ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ පැවති ජීවිතාකල්පය ම ඔබ තුළත් පවතීවා !"**

**(පිලිප්පි 2 : 4-5)**

**අරමුණ :**

- කුඩා කල පටන් සහාව තුළින් සමාජයට සේවයක් ඉටු විය යුතු බව අවබෝධ කර ගැනීම.
- කුඩා දරුවන් ලෙස සමාජය සමඟ සම්බන්ධකම් ඇති කර ගැනීමේ අවශ්‍යතාවය අවබෝධ කර ගැනීමට හැකි වීම.
- ළමා කාලයේ පටන් සමාජය කෙරෙහි හැඟීමක් හා උනන්දුව වර්ධනය කිරීම.
- අවශ්‍යතා ඇති පුද්ගලයන්ට ආධාර සැපයීමේ වැදගත් කම ඉගෙන ගැනීම.
- යහපත් දෙයක් කිරීම සඳහා තම විවේකකාලය කැප කිරීමේ වැදගත් කම ඉගෙන ගැනීම.

➢ **ඔබට පහසුවෙන් කළ හැකි සමාජ සත්කාර කිහිපයක් පහත දැක්වේ**
  - පැළ සිටුවීම සහ ඒවා රැක බලා ගැනීම
  - ඔබ හොඳින් දන්නා තනිව සිටින මහලු පුද්ගලයන්ට නිතර කතා කරන්න. ඔවුන්ට ඇසෙන සේ බයිබලය කියවන්න. ඔවුන්ට ඇහුම්කන් දෙන්න.

➢ **ඔබගේ මිතුරු මිතුරියන් සමඟ කළ හැකි කණ්ඩායම් ක්‍රියාකාරකම්**



  - දේවස්ථානයේ වත්ත හෝ පොදු ස්ථානයක කුණු ඉවත්කර පිරිසුදු කිරීම
  - ආරෝග්‍ය ශාලාවක ළමා වාට්ටුවට/ ළමා නිවාසයකට ගොස් රෝගී දරුවන් සමඟ කෙටි කාලයක් ගත කිරීම.
  - වැඩිහිටි නිවාසයකට ගොස් ඔවුන්ට උපකාර කරන්න.

- අන්අයට සේවය කිරීම සතුටේ අංගයක් බව ඉගෙන ගන්න.
- අසීරු අවස්ථාවලදී එකිනෙකාට උපකාර කිරීමේ වැදගත්කම අවබෝධ කරගන්න.
- ඔබ යමෙකුට සේවය කළ අවසන් අවස්ථාව පිළිබඳව සිතන්න. එය කරන අතරතුර ඔබට දැනුනු හැඟීම කුමක් ද?

❖ **ඔබට කළ හැකි සමාජ සත්කාර ලැයිස්තුවක් සකස් කරන්න.**

සමාජයට සේවය කරන පුද්ගලයින් වෙනුවෙන් සහ වඩා හොඳින් සමාජ සත්කාර සඳහා දායක වීමට හැකියාව ලබා දෙන ලෙස ඉල්ලා යාච්ඤා කරන්න.

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**